## 2019 අප්‍රියෙල් මස සංඝ පවුල් දින සුපුවත
## ක්‍රිස්තියානි සංඝය උත්ථාන වූ සමිඳාණන්ගේ ශරීරයයි

01. ආරම්භක ප්‍රශංසාව : පුබුදු ගී අංක 03 "ආ එනු මැනේ...."

02 ප්‍රශංසාවට යොමුව :

**"ක්‍රිස්තුන් වහන්සේ උත්ථාන කරනු නොලැබූ සේක් නම් අපගේ දේශනා කිරීම නිරර්ථකය. ඔබගේ ඇදහීමත් නිරර්ථකය"** (1කොරින්ති 15:14).

උත්ථානය අපේ මනසට ගෝචර වන, පියවි ඇසට පෙනෙන චිත්‍රයක්වත්, අදහසක්වත්, හැඟීමක්වත්, සංකල්පයක්වත් නොව මහා සත්‍යතාවයකි. මරණය පරාජය කරමින් උත්ථාන වී අප අතර ජීවමානව වැඩ වසන සමිඳාණන් වහන්සේව හමුවීම, ඇසුරු කිරීම ජීවමාන අත්දැකීමකි. පිබිදුනු කිතුනුවන් ලෙසත් උත්ථාන වූ සමිඳාණන් වහන්සේව හමුවීමේ භාග්‍ය ලැබුවන් ලෙසත් ගැඹුරු ප්‍රීතියකින් යුතුව අද දවසේ ප්‍රශංසාවට ඇතුළු වෙමු.
පුබුදු ගී අංක 19 "අප ජීවනයද ඔබ වේ..."

03. ආපසු බැලීම :

i දින 40ක චතාරික කාලයක් පසු කරමින් අප ආ ගමනේදී අප සමිඳාණන් වහන්සේ අත්දුටු දුක්විඳීම, මරණය හා උත්ථානය අප ජීවිත තුළ අත්දුටුවේ කෙසේ දැයි බෙදා ගන්න.

ii උත්ථාන වූ සමිඳාණන් වහන්සේව හමුවන්නට ඔබ ගත් පියවරයන් බෙදා ගන්න.

04. දවසේ සුපුවත :

(අ) ක්‍රියා 9:1-9 පොදුවේ ප්‍රකාශ කරන්න.

i අප සවන් දුන් ශුද්ධ ලියවිලි පාඨය තුළ උත්ථාන වූ සමිඳාණන් වහන්සේ පිළිබඳ අත්දැකීමක්

ii ශු.පාවුළු තුමා පිළිබඳ අත්දැකීමක් හතර දෙනාගේ කුඩා සංඝ තුළ බෙදා ගන්න.

(ආ) ක්‍රියා 9:3-5 දක්වා වගන්ති කෙරෙහි අපගේ අවධානය යොමු කරමු.

"මෙසේ ඔහු ගමන් කරමින් දමස්කයට ළං වූ කල, හදිස්සියෙන් අහසින් ආලෝකයක් ඔහු අවට බැබළිණි. ඔහු භ්‍රාන්ත වී බිම වැටුණේය. එවිට: 'සාවුල් සාවුල් ඔබ මට පීඩා කරන්නේ මන්දැ'යි කියන හඬක් ඔහුට ඇසිණි. "ස්වාමිනී ඔබ කවරෙක්දැ"යි ඔහු ඇසීය. මම ඔබ විසින් පීඩා කරනු ලබන ජේසුස්ය."

* සාවුල් එදා පීඩා කරනු ලැබුවේ, විනාශ කරනු ලැබුවේ ක්‍රිස්තියානි ජනතාවය. එහෙත් සමිඳාණන් වහන්සේ ප්‍රකාශ කරනු ලබන්නේ සාවුල් පීඩා කරනු ලැබුවේ තමන් වහන්සේට බවය. 'සාවුල් සාවුල් ඔබ මට පීඩා කරන්නේ මන්ද?...' මේ තුළින් ශුද්ධාත්මයාණන් වහන්සේ අපට උගන්වන්නේ ක්‍රිස්තියානි සංඝය උත්ථාන වූ සමිඳාණන් වහන්සේගේම ශරීරය බවයි. එමනිසා සංඝයට පීඩා කරන්නා උත්ථාන වූ සමිඳාණන් වහන්සේට පීඩා කරන්නෙකි. සංඝය විවේචනය කරන්නා එසේ කරන්නේ උත්ථානවූ සමිඳාණන් වහන්සේටම ය.

* උත්ථානවූ සමිඳාණන් වහන්සේගේ ශරීරය වන සංඝය ගොඩ නගන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේමය ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය තුළ සංඝ ගොඩනැගීමට ශු.පාවුළුතුමාව දායක කරගත් ශුද්ධාත්මයාණන් වහන්සේට ඉඩ දුන් ශු.පාවුළුතුමා සංඝ ගොඩ නගන්නට සිය දායකත්වය සැපයීමේදී, එසේ කරන්නේ ක්‍රිස්තු ශරීරය ගොඩනැගීමට බව අත්දකින්නට ඇත. ඒ බව ශුද්ධ ලියවිල්ල අපට පසක් කර දෙයි. උත්ථාන වූ සමිඳාණන් වහන්සේ පිළිබඳ සාක්ෂිකරුවෙකු ලෙස තමා අත්දුටු ස්වාමින් වහන්සේ ගැන දේශනා කරමින් ගම්නියම් ගම් සිසාරා සැරි සැරුවේ මේ අත්දැකීම නිසාමය.

05. අප දෙසට: සාකච්ඡාව සඳහා

i ඔබේ සංඝය ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය බව ඔබ විශ්වාස කරනවාද?

ii ඔබේ සංඝයට ඔබ පීඩා කරන විට (සංඝය තුළ සිටින දුබලයන් පිළිබඳව, එකිනෙකාගේ දුබලකම් පිළිබඳ විවේචනය කරන විට) ඔබ එසේ කරන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයට බව ඔබ විශ්වාස කරනවාද?

iii උත්ථාන වූ සමිඳාණන් වහන්සේව හමුවන, ඇසුරු කරන කෙනෙකු ලෙස අපට ලැබී ඇති කැඳවීම, කිතුනු ශ්‍රාවකයෙකු ලෙස සාක්ෂි දැරීමට ය. සාක්ෂි දැරීම තුළින් සංඝයේ වර්ධනය සඳහා ක්‍රියා කිරීමටය. පුද්ගලයෙකු ලෙසත්, සංඝයක් ලෙසත් අපට ගත හැකි ක්‍රියා මාර්ග මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ඇ) ක්‍රියා 9:1-9 දක්වා කොටසෙහි සඳහන් ශු.පාවුළු තුමා පිළිබඳ අත්දැකීමේදී පාවුළු තුමාගේ ජීවිතය තුළ කුමක් සිදුවන්නට ඇතිද? එය එතුමා පෙර සිටියාට වඩා හොඳ මිනිසෙකු වීමද? එය හුදෙක් එතුමාගේ ජීවිතය තුළ සිදුවූ වෙනසක් පමණක්ද?

වචනයේ සේවකයා සඳහා :

* පාවුළු තුමාගේ ජීවිත පැවැත්මේ වෙනසකට වඩා ගැඹුරු යමක් එතුමා තුළ සිදු විය.
* උත්ථාන වූ සමිඳාණන් වහන්සේව හමුවීමෙන් ක්‍රිස්තු ශ්‍රාවකයෙකු වීමේ බලය ලැබිණි.
* විශේෂ දූත කාර්යයක් සඳහා තමාව වෙන් කර ඇති බව අයිති කර ගන්න.
* ක්‍රිස්තුන් වහන්සේ තම ජීවිතයේ එකම සමිඳාණන් බව අත්දකිමින් නිරතුරු දේව කැමැත්ත පමණක් ඉටු කරන්නට තීරණයක් ගන්නට ඇත.
* ඔබත් / මමත් ඔවුන් වහන්සේව හමුවන, ඇසුරු කරන අයය. අපේ ජීවිත තුළ උත්ථාන වූ සමිඳාණන් වහන්සේව හමුවීමත් සමග ඇති වී ඇති වෙනස කුමක්ද?
* අපේ ජීවිතය තුළ, එදිනෙදා සිදුවීම් තුළ උත්ථාන වූ සමිඳාණන් වහන්සේව හමුවන්නට අප අවදියෙන් ද?
* ඔබත් / මමත් විශේෂ දූත කාර්යයක් සඳහා අපව වෙන්කර ඇති බව, අප ඔවුන් වහන්සේට අවශ්‍ය කෙනෙක් බව විශ්වාස කරනවාද?

06. හතර දෙනාගේ පුංචි සංඝයන් ලෙස සැකසෙමින් ගැඹුරු මනස්ස්ථාපනයකට ඇතුළු වෙමින් යාච්ඤා කරන්නට සූදානම් වෙමු.

* උත්ථාන වූ සමිඳාණන් වහන්සේව හමු වූ පිබිදුනු කිතුනුවෙකු ලෙස සාක්ෂි දරන්නට මට නොහැකි වූ, අතපසු වූ, මගහැරියාවූ සියළු අවස්ථා ගැන පසු තැවෙමු. මනස්ස්ථාපනය වෙමු.

07. අවසන් ප්‍රශංසාව :

පුබුදු ගී අංක 319 (නව) පුබුදු ගී අංක 332 (පැරණි)
"ඔබටම හිමියි ...."

************************